# ශ්‍රී ලංකාවඃ නව ආරම්භයක ට කාලයයි .

## සියළු ජනාධිපති අපේකෂකයින්ට ආයාචනයක්

**මී**ළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් වි සිටින සෑම අපේක්ෂයෙකු විසින් ම මානව අයිතිවාසිකම් වැඩි දියුණු කිරිම සම්බන්ධයෙන් සිය උපරිම කැප විම කරන බවට සහතික විය යුතුය. ඔවුහු දශක ගණනාවක් ශ්‍රී ලංකාව තුළ වසංගතයක් ලෙස පැතිරි ඇති මානව අයිතීන් උල්ලංඝනය කිරිමත්, එකී ව්‍යසනයන්ට හේතු කාරක වු වරදින් නිදොස් කිරීමේ වාතාවරණය නවතා දමන බවටත් පොරොන්දු විය යුතුය.

ජනාධිපති අපේක්ෂයන් විසින් ප්‍රසිධියේ ම ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ වගකිම් සපුරා ලමින්; යහපාලනය, නිතීයේ ආධිපත්‍ය සහ මානව අයිතීන් විෂයෙහි ගරු කරන බවට ප්‍රතිඥ දිය යුතු බව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඉල්ලා සිටියි. ආරම්භක පියවරක් වශයෙන් සියළු ම ජනාධිපති අපේක්ෂකයින් පහත දැක්වෙන කරුණු දහයකින් යුක්ත න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් ප්‍රතිඥවක් දිය යුතු යැයි ද ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඉල්ලා සිටියි.

ජනවාරි 26 දිනට නියමිත ශ්‍රී ලංකා ජනාධිපති වරණයේ දි මානව අයිතිවාසිකම් හා මානවීය නිතීය උල්ලංඝනය පිළිබඳ වගවිම වැදගත් ප්‍රතිපත්තිමය ගැටළුවක් බවට පත් විම ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය අගය කරයි. අපේක්ෂකයින් 22 දෙනෙකු තරඟ කරනු ලැබුවත් දේශපාලන වේදිකාවේ වැඩි ඉඩක් අත්පත් කර ගෙන සිටින්නේ අනුප්‍රාප්තික ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහු ගේ හිටපු යුද්ධ හමුදා අණ දෙන නිලධාරි හා ආරක්ෂක මාණ්ඩලීක ප්‍රධානී විශ්‍රාම ලත් ජනරාල් සරත් පොන්සේකා ය. ජනරාල් පොන්සේකා විසින් සිය ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රකාශයට පත් කිරිමෙන් පසු, දේශපාලනඥයින් දෙදෙනාම එල් ටි ටි ඊ ය යුද්ධමය වශයෙන් ජයග්‍රහණය කිරිමේ ගෞරවයට ජන්දදායකින් ඉදිරියේ

හිමිකම් කී නමුත් යුද්ධයේ අවසාන අදියරයේ දි සිදු වු මානව අයිතිවාසකම් උල්ලංඝණයන් පිළිබඳ වගකිම මග හැරිමටත් වග බලා ගත්හ.

අවුරුදු 25 අධික කාලයක් පැවති ආයුධ සන්නද්ධ අරගලයෙන් ශ්‍රී ලංකාව හිස ඔසවන්නට සමත් වුයේ මෑතක දීය. අරගලය පැවති කාලය තුළ දී දෙපාර්ශවයම මානවීය නිතී උල්ලංඝනය කිරිමට පසුබට නොවීය. එල් ටි ටි ඊ ය විසින් වැඩි හිටියන් හා ළමුන් බලහත්කාරයෙන් බඳවා ගත් අතර, සිය පසු බසින හමුද සමග සිවිල් වැසියන් ටත් ගමන් කිරිමට විධානය කරමින් ඉදිරියට එන ශ්‍රී ලංකා රජයේ යුද්ධ හමුද හා එල් ටි ටි ඊ සටන් කාමින් අතර පවුරක් වශයෙන් ක්‍රියා කිරිමට ද සිවිල් වැසියන් ට බල කරන ලදි. දහස් ගණනක් සිවිල් වැසියන් ගැටුම් උත්සන්න වු ප්‍රදේශයන් හි රැදි සිටින්නට බල කළ අතර, පලා යන්නට තැත් කළ සිවිල් වැසියන් ට එල් ටි ටි ඊ ය විසින් වෙඩි තබා ඝාතනය කරන ලදි. තවද සිවිල් වැසියන් ඒක රාශීවි සිටි ස්ථාන වලට රජයේ හමුද විසින් ද කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරිම නිසා දහස් ගණනක් සිවිල් වැසියන් මිය ගියේය.

යුද්ධය පැවති සමයේ හමුද හටයින් ගේ හා ඔවුන් ගේ අණ දෙන නිලධාරීන් ගේ ත්, සිවිල් නායකයින් ගේත් හැසිරිම පිළිබඳ වගවිම ඉතාමත් වැදගත්ය. මෙය සිය බිඳ වැටුන සිය මානව හිමිකම් වාර්තාව යලි පිහිටුවා ගැනිමේ දි ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝගයේ එක් කොටසක් වන අතර ආණ්ඩුව, අධිකරණ ක්‍රමය හා නිතීයේ ආධිපත්‍යය සම්බන්ධයෙන් නැති වි ගිය මහජන විශ්වාසය යලි ඇති කර ගැනිම ද කළ යුතුව තිබේ,අද ශ්‍රී ලංකාවට සිය රාජ්‍ය ආයතන නැවත ගොඩ නගා ගැනිමේ අවස්ථාව උද වි තිබිම නිසා සියලුම තැනැත්තන් නීතිය හමුවේ සමාන වන එක හා සමානව නීතියේ රැකවරණය ලබන ක්‍රමයක් නිර්මාණය කර ගත හැකිය. යුක්ති සහගත, සාධාරණ සහ සදචාරාත්මක සමාජයක් පිහිටුවා ගැනිමට නම් සියලුම ජනාධිපති අපේක්ෂකයින් විසින් ඡන්දදකයින් ට එබඳු අරමුණක් වෙනුවෙන් තමන් කැප වන බවට සහතික විය යුතුය.

# සියලුම ජනාධිපති අපේක්ෂකයින් වෙත මානව හිමිකම් න්‍යාය පත්‍රයක්

## 1. හදිසි නීතිය යටතේ පුද්ගලයින් අන්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනිම  සහ රඳවා තබා ගැනිම අවසන් කිරිම හා සියලුම රැදවියන් ගේ අංග සම්පුර්ණ නාම ලේඛනයක් ප්‍රසිද්ධ කිරිමඃ

ශ්‍රී ලංකාවේ මිළඟ ජනාධිපතිවරයා වර්තමාන රජය මෙන් ම විරුද්ධ පාක්ෂික අපේක්ෂකයින් විසින් ද අත් අඩංගුවට ගෙන ඇති දහස් ගණනක්, ඔවුහු එල් ටි ටි ඊ ය සමග සම්බන්ධකම් ඇතැයි සැක කොට රඳවා ගෙන සිටිති. යුද්ධ හමුදව විසින් උතුරු පළාතේ හමුද කඳවුරු තුළ 11,000 ආසන්න පිරිසක් යුද්ධ කලාපයෙන් පැන ඒමේ දි අත් අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති අතර, තවත් සිය ගණනක් දිවයිනේ විවිධ පළාත් වල දි අත් අඩංගුවට ගෙන රඳවා ගෙන සිටිති. මේ සියලුම රැදවියන් සම්බන්ධයෙන් නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටියට ද දේශීය  නීතියෙහි ඌනතාවයන් පිරිමැසිමට අවශ්‍ය අවස්ථාවන් හි දි ජාත්‍යයන්තර ප්‍රමිතීන් ට ද අනුකුලව සිවිල් අධිකරණ මගින් කටයුතු කළ යුතුය. එසේ කිරිමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැති නම් එවැනි තැනැත්තන් වහාම අත් අඩංගුවෙන් නිදහස් කළ යුතුය.

නඩුකරයන් පවත්වා ගෙන යන රැදවියන් සම්බන්ධයෙන් මෙන් ම නඩු පැවරිම පිණිස රඳවා ගෙන සිටින තැනැත්තන් හට ද ඇප ඉල්ලුම් කිරිමට, රැදවියන් ට නීති උපදෙස් ලබා ගැනිමටත්  වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනිමට, පවුලේ සාමාජිකයින් මුණ ගැසිමට පමණක් නොව ස්වාධින අධිකරණයක් ඉදිරියේ තමන් රඳවා ගෙන සිටිමේ නීත්‍යානුකුල භාවය ප්‍රශ්න කිරිමට ද  අවසර දිය යුතුය.

මින් ඉදිරියට අපරාධ සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනිම් සියල්ලක් ම එලෙස කටයුතු කිරිමට නීතියෙන් අවසර ලත් තැනැත්තන් විසින් පමණක් කරන බවටත් යමෙක් අත් අඩංගුවට ගැනිමට පෙර එසේ කරනු ලබන තැනැත්තා තමාව හදුන්වා දීම අනිවාර්ය කිරිමත් අවශ්‍ය නම් එම අත් අඩංගුවට ගැනිම සාක්ෂි දැරිමට ඉදිරිපත් වන්නන් ට එසේ පෙනි සිටිමට ද අවශ්‍ය වතාවරණය ඇති කරන බවට සහතික විය යුතුය. තවද අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් හැකි තරම් ඉක්මනින් නීතිය ඉදිරියට ගෙන යන්නටත් නීතියෙන් නියම කොට ඇති ස්ථාන යන් හි පමණක් රදවා තැබිමට ක්‍රියා කරන බවටත් පොරොන්දු විය යුතුය.

තමන් බලයට පත් වුවහොත් අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් හෝ තැනැත්තියන් රඳවා තබා ඇති ස්ථාන හා නිදහස් කිරීම පිළිබඳ සියලු නිවරදි තොරතුරු ඔවුන් ගේ ආසන්නම ඥාතීන් ට නීතිඥයින් ට හා අධිකරණයට ලබා දෙන බවට ප්‍රකාශ කළ යුතුය.

ඥාතීන්ට හා නිතිඥයින්ට කඩිනමින් අධිකරණ ක්‍රියා මාර්ග ගැනිමට ඉඩකඩ තිබිය යුතු අතර එමඟින් සිරකරු රඳවා තිබෙන්නේ කුමන ස්ථානයක ද කවර අධිකාරියක් යටතේ ද යන්න ඔවුන්ට දැන ගැනිමට හැකි වනු ඇත. සිය මුලස්ථානයෙහි මෙන් ම පරිවාර රැඳවුම් මධ්‍යස්ථානයන් හි ද රඳවා ගන්නා රැඳවියන් සම්බන්ධ අංග සම්පූර්ණ වාර්තා බලධාරින් විසින් නඩත්තු කළ යුතුය. මෙම තොරතුරු ආසන්නතම ඥාතීන්ට, විනිශ්චයකාරවරුන්ට, රැඳවියන් පිළිබඳව සොයා බලන නිල සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුලු අනෙකුත් අදළ පාර්ශවයන්ට ලබා දිමට කටයුතු කරන බවට වග බලා ගත යුතුය.ත්‍රස්තවාදය මර්දනය කිරිමේ මුවාවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩු ඉතාමත් නින්ද සහගත පියවරයන් කිහිපයක් අනුගමනය කරන්නට පුරුදු වි සිටීති. උදහරණයක් වශයෙන් බලධාරීන් ට අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනිමට හා දින නියමයක් නොමැතිව රඳවා තබා ගැනිමට ඉඩ සලසන විශේෂ ආරක්ෂක අණපණත් ලෙස හඳුන්වනු ලබන ත්‍රස්තවාදය වැළැක්විමේ පණත හා මහජන ආරක්ෂක ආඥා පනත යටතේ දශක ගණනාවත් තිස්සේ පවත්වා ගෙන යනු ලබන හදිසි නීති රෙගුලාසි දැක්විය හැකිය.

ජනාධිපති අපේක්ෂකයින් විසින් ජාත්‍යයන්තර නීතීන්ට හා ප්‍රමිතීන්ට අනනුකුල වන සියලුම හදිසි නීති රෙගුලාසි අහෝසි කිරීමටත් විශේෂයෙන් ම අන්තර් ජාතික නීතිය යටතේ බරපතළ අපරාධකරුවන් ට දඬුවම් නොලබා සිටිමට සලසා තිබෙන ඉඩ කඩ අහුරා දමන බවටත් ප්‍රතිඥා දිය යුතුය. එසේ ම අපේක්ෂකයින් විසින් ආරක්ෂක හමුදා විසින් අනීතියානුකුල ලෙස අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් බලහත්කාරයෙන් රදවා තබා ගෙන වධ හිංසා හා කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිලිවලට යටත් කිරිමෙන් අනතුරුව පුද්ගලයින් අතුරුදහන් කොට දැමිමට පාවිච්චි කරන රහසිගත ස්ථාන හෙළි දරව් කොට අවසන් කරන බවටත් ප්‍රකාශ කළ යුතුය.

## 2. වධ හිංසා, කෲර අමානුෂික, අවමන් සහගත සැලකිම් වලට

## භාජනය කිරිම හා  අතුරුදහන් කිරිම් නිමා කිරිම:

ශ්‍රී ලංකාව විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර පළාත් වල සහ කොළඹ බලහත්කාරයෙන් පුද්ගලයින්  අතුරුදහන් කිරිම,  සම්බන්ධයෙන් දිර්ඝ ඉතිහාසයක් සහිත රටකි. ආණ්ඩුවේ ආරක්ෂක හමුද හා පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් විශේෂයෙන් ම ත්‍රස්තවාදි සැකකරුවන් ලෙසට අත්අඩංගුවට ගනු ලබන්නන්  වධ හිංසා කෲර අමානුෂික අවමන් සහගත සැලකිම් වලට භාජනය කිරිම නිරන්තරයෙන් ම වාර්තා වෙයි.

ජනාධිපති අපේක්ෂකයින් විසින් මෙම භාවිතයන් අවසන් කරන බවටත්; ශ්‍රී ලංකාවේ නීති රිති ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට සරිලන ලෙස සංශෝධනය කරන බවටත්, වධ හිංසා, කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිම් අවසන් කරන බවටත්, ඉහත කි කාරණා නිසා වින්දිතයින් බවට පත් වුවන් ට යුක්තිය හා වන්දි ලබා දිමටත්, ඔවුහු පුනරුත්ථාපනය කිරිමටත්, මෙවැනි තත්වයක් නැවත ඇති නොවන බවට වගබලා ගැනිම පිණිස අවශ්‍ය පියවර ගන්නා බවටත් ප්‍රකාශයට පත් කළ යුතුය.

## 3. අභ්‍යයන්තරව අවතැන් වුවන් ගේ සහ නැවත පදිංචි වන්නන් ගේ අයිතිවාසිකම් වලට ගරු කිරිමටත් ඒවා ආරක්ෂා කරන බවටත් සහතික විම

මේ අවස්ථාව වන විටත් ගැටුම් නිසා අවතැන් වි කඳවුරු තුල සිටින්නා වුද (100,000 කට අධික පිරිසක්  තවමත් කඳවුරු තුළ සිටියි), නිවහනක් හා සහනාධාර සම්න්ධයෙන් රජය මත බලාපොරොත්තු තබා තිබෙන්නන් ගේ ද, මිට පෙර සිය මුල් ගම්බිම් ආසන්නයේ බලහත්කාරයෙන් නැවත පදිංචි කරනු ලැබුවා වු තැනැත්තන් ගේ ද ඇතුලු සියලුම අවතැන් වු ජනතාව ගේ ආරක්ෂාවත් ඔවුන් ට හිමි මානවීය ආධාරත් නොපමාව සපයා දෙමින් අවතැන් වුවන් ගේ අයිතීන් සුරුකිම හදිසි ජාතික අවශ්‍යතාවයක් වෙයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්  සහ ජාත්‍යයන්තර නීතියෙන් සහතික කොට තිබෙන්නා වු අවතැන් වුවන් ගේ සහ නැවත පදිංචි වන්නන් ගේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරිම හා  ආරක්ෂා කිරිම ඇතුලු යාමේ ඊමේ නිදහස, පුද්ගල නිදහස හා ආරක්ෂාව, සෞඛ්‍ය, අධ්‍යාපනය, ප්‍රමාණවත් ජිවන තත්වයක්, වධ හිංසා හා කෲර අමානුෂික පහත් සැලකිල්ලකට භාජනය නොකිරිම,

බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම නතර කිරිම සහ අවතැන් වුවන් ගේ කඳවුරු කළමනාකරණය කිරිමේ දි මෙන් ම නැවත ස්ථිර වශයෙන් හෝ තාවකාලිකව යලි පදිංචි කිරිමේ තීන්දු තීරණ ගැනිමේ දි අවතැන් වුවන් ගේ ස්වාධීන කැමැත්ත තීන්දු තීරණ ගැනිමේ දි සලකා බලන බවටත් ජනාධිපති අපේක්ෂකයින් ප්‍රකාශ කළ යුතුය.

අවතැන් වුවන් සියලු දෙනාටම තමන් වාසය කරන කඳවුරෙන් පිටතට යාමට හා ඊමට අවසරත් ඔවුන්ට අනෙකුත් තාවකාලික පහසුකම් කිසිදු අවහිරතාවයකින් හෝ බාධාවකින් තොරව ලැබිය යුතුය. අවතැන් වු ජනතාව වර්ගය, ස්ථිර පදිංචිය හා අවතැන් විමට පෙර පදිංචිව සිටි ස්ථානය පදනම් කොට ගෙන කිසිදු වෙනසක් කමක් කවරෙකුටත් නොකළ යුතුය.

අවතැන් වුවන් කඳවුරක වේවා පවුලේ සාමාජිකයින් සමග තාවකාලික වාසස්ථානයක රැදි සිටින්නෙක් වේවා ඒ සියලු දෙනාටම ප්‍රමාණවත් සහනාධාර ලබා දිය යුතුය[1]. සිය මුල් පදිංචි ස්ථාන කරා යාමට උත්සාහ දරන තැනැත්තන්ට හා විකල්ප ස්ථානයන් හි ස්ථිර පදිංචියට යාමට කැමැති වන සියලු දෙනාටම එසේ කිරිමට දිරිමත් කළ යුතු අතර හිඟ පාඩුවක් නොමැතිව ද්‍රව්‍යමය ආධාර ලබා දිය යුතුය.

අවතැන් වුවන් ගේ අයිතීන් හා නීතියානුකුල තත්වය, පවුලේ සාමාජිකාවන් සොයා ගැනිම හා අවතැන් වුවන් ගේ මුල් පදිංචි ස්ථානයන් හි පවත්නා සැබෑ තත්වය ඇතුලු අවතැන් වුවන් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පැහැදිලිව හා සරලව ප්‍රකාශයට පත් කළ යුතු අතර, අවතැන් වුවන් ට ඒ අනුව නැවත පදිංචියට යාම පිළිබඳ ව දැනුවත් හා ස්වාධින තීරණ කරා එළඹීමට හැකියාවක් ලැබේ.

කඳවුරු වලින් පිටව යන්නන් ගේ හා නැවත පදිංචියට යන්නන් ගේ ගේ ආරක්ෂාව, ඔවුන් ට ප්‍රමාණවත් පරිදි සහනාධාර ලැබෙන්නේ ද යන්න හා ඔවුන් ගේ මානව හිමිකම් සුරකෙන්නේ ද යන්න නියාමනය කිරිමට ජාතික හා ජාත්‍යයන්තර මානවීය හා මානව හිමිකම් සංවිධානයන් ට අවසර දිය යුතුය.

---

[1] අවතැන් වුවන් සිය මුල් පදිංචි ස්ථාන කරා යමින් සිටින අතර බොහෝ විට එම ප්‍රදේශ වල නිවාස හා යටිතල පහසුකම් සම්පූර්ණයෙන් ම විනාශ වි ඇති බැවින් නැවත යථාතත්යට පත් කිරිමට සෑහෙන කාලයක් ගත විය හැකිය

## 4. පසුගිය වැරදි වලින් පාඩම් ඉගෙන ගැනිමඃ

ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය දේශපාලන බලපෑම් වලට විවෘතය. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ පලදායි වැඩ පිළිවෙළක් කිසි විටෙකත් ක්‍රියාත්මක නොවූ අතර මානව හිමිකම් පැමිණිලි පොලිසිය මගින් විභාග නොකිරිමත්, අඩුම තරමින් අධිකරණයෙහි විභාග කරන ලද මානව හිමිකම් නඩු පවා ප්‍රමාණවත් පරිදි විමර්ශනය නොකිරිමත් පැහැදිලිව දක්නට ලැබුනි. ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා විසින් ප්‍රසිද්ධියේ ම මෙරට අධිකරණ ක්‍රමය විසින් අවංකවම මානව හිමිකම් පිළිබඳ වගකීම පැහැර හැරිය බව ප්‍රකාශ කළ යුතු අතර නිසි අපරාධ පරීක්ෂණයක් කිරිම වෙනුවට හිටි අඩියේ පත් කරන ලද කොමිසන් සභා ආදේශ කිරිම පිළිබඳවත් ඉලක්ක කොට ගෙන අපරාධ යුක්ති විනිශ්චය කිරිමේ ක්‍රමය සමාලෝචනය කළ යුතුය. මෙම ප්‍රයත්නය අවංක, රජයේ පූර්ණ සහයෝගය ලබන ස්වාධීන හා අපක්ෂපාතී මෙන් ම සාධාරණ කාල රාමුවක් යටතේ අවසාන දින නිමයක් තුළ දරන ප්‍රයත්නයක් විය යුතුය. ශ්‍රී ලංකා අධිකරණ ක්‍රමයෙහි ඌනතාවයන් රාශියක් පමණක් නොව ඊට පිළියම් ද මේවන විට හදුනා ගෙන ඇති අතර ඉන්;

- නියම පොලිස් පරික්ෂණ; පරික්ෂණ කොමිසන් සභා සහ දේශීය නීතිය ප්‍රමාණවත් නොවන තන් හි අන්තර් ජාතික නීතිය යටතේ බරපතළ අපරාධ කරුවන් ගේ නඩු විභාග කිරිම හා දඩුවම් කිරිම පිළිබඳ ක්‍රියාත්මක කරන ලද වංචනික වැඩ පිළිවෙළවල් හෙළිදරව් කිරීම
- ඉහත කි පරීක්ෂණයන් ට අදළව මෙතෙක් රහස්‍ය ලෙස තබා තිබු වාර්තා පරීක්ෂා කොට බලා ප්‍රසිද්ධ කිරීම හා එබඳු ලිපි ගොනු අදළ නිර්දේශ සමග මහජනයාට පරිශීලනය කිරිමට ඉඩ සැලැසිම
- ඉහත කී වංචනික වැඩ පිළිවෙළවල් යලි ඇති විම වැළැක්විම පිණිස ආදළ ව්‍යවස්ථාදයක, පරිපාලන හා ප්‍රායෝගික පියවරයන් ව්‍යවස්ථානුකුල හා අවශ්‍ය අවස්ථා වලදි අන්තර් ජාතික මානව හිමිකම් නීතියට අනුකුලව යෝජනා කිරීම

විශේෂයෙන් ම 2006 නොවැම්බර් මස ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් බරපතළ මානව හිමිකම් සිද්ධි 16 ක් පරීක්ෂා කිරිමට පත් කරන ලද විමර්ශන පරීක්ෂණ කොමිසන් සභා වාර්තාව ඇතුලු 2006 ජනවාරි මස ත්‍රිකුණාමලයේ දි ඝාතනය කරන ලද තරුණයින් පස් දෙනා සහ 2006 අගෝස්තු මස ඇක්ෂන් කොන්ට්‍රා ලා

ෆාම් සංවිධානයේ සේවකයින් 17 දෙනා ඝාතනය කිරිම පිළිබඳ පරීක්ෂණ කොමිසන් සභා වාර්තා ප්‍රකාශයට පත් කළ යුතුය.

## 5 මාධ්‍ය නිදහස ඇතුලු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහතික කිරීමඃ

විසම්මුතිය නිහඩ කිරිම පිණිස ශ්‍රී ලංකාව ආරක්ෂක නීති උපයෝගි කර ගනියි. උදහරණයක් වශයෙන් ජන මාධ්‍යවේ දී ජේ තිස්සනායගම් නැගෙනහිර පළාතේ දි යුද්ධ හමුද මෙහෙයුමක් පැවති අවස්ථාවක ශ්‍රී ලංකා රජය ද්‍රවිඩ ජනතාවට සලකන ලද ආකාරය විවේචනය කිරීම වරදක් කොට, ඔහුට බරපතළ වැඩ ඇතිව විසි අවුරුද්දක සිර දඩුවමකට යටත් කරන ලද්දේ ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේය. 2010 ජනවාරි 11 දින තිස්සනාගම් ඇප මත නිදහස් කිරිම ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් අගය කරන අතරම ඔහු දේශපාලන සිරකරුවෙක් ලෙස සලකා ඔහුට දි ඇති දඩුවම අවලංගු කරන මෙන් ද ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය පත් විමට නියමිත නව ජනාධිපති වරයා ගෙන් ඉල්ලා සිටියි.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හකුලන නීති රීතී වලට අමතරව ජන මාධ්‍ය වේදීන් ට, නිතිඥයින්ට, ත්‍රිවිධ හමුදව හා පොලිසියට එරෙහිව සාක්ෂි දෙන සාක්ෂිකරුවන්ට සහ මානව හිමිකම් ආරක්ෂකයින්ට නාදුනන තැනැත්තන් විසින් පහර දිමේ රටාවක් මතු වි තිබෙන අතර ඊට බලයේ සිටින ආණ්ඩුවල සම්බන්ධයක් ඇතැයි පිළි ගනු ලැබේ[2]. මෙම නඩුකර ද තර්ජන හා පහර දිම් සියල්ලේහි අවසාන ප්‍රතිඵලය වුයේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ මහජන විශ්වාසය සෝද පාලුවට ලක් විමිත් ඇඟ කිලිපොළා යන පරිද්දෙන් අදහස් ප්‍රකාශ කිරිමේ හා සමාගමයේ නිදහස කෙරෙහි බලපෑමයි.

ශ්‍රී ලංකා ඡන්දදායකින් ට අපේක්ෂකයින් පිළිබඳ ව තක්සේරුවක් කිරිමට අවශ්‍ය තොරතුරු ලබා ගැනිම පිණිසත්, ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් මතයක් ඇති කර ගැනිමටත්, රාජ්‍ය නිලධාරින් ගේ රාජකාරි කටයුතු නියාමනය කිරිම පිණිසත් නිදහස් ජන මාධ්‍ය අවශ්‍ය වෙයි. ජන මාධ්‍ය වේදීන් ට සිය වෘත්තීය කාර්ය භාරය නීතිමය දණ්ඩන වලට නොබියව හා අවමානයට හා ප්‍රචණ්ඩත්වයට ගොදුරු නොවි ඉටු කළ යුතු වෙයි.

---

[2] 2004 සිට ජනමාධ්‍යවේදීන් 15 ඝාතනය කොට තිබෙන අතර තවත් ජනමාධ්‍යවේදීන් 11 දෙනෙකුට ශ්‍රිලංකාවෙන් පළා ගොස් එතර වාසය කරයි

ජන මාධ්‍යවේදීන් ට හා මානව හිමිකම් ආරක්ෂකයින් හට අවතැන් වුවන් රඳවා සිටින කඳවුරු තුලට ඇතුල් විමට ඉඩ නොදුන් අතර ඔවුන්ට යාපනය ට ඇතුල් විමට ආරක්ෂක අමාත්‍යංශය වෙතින් අවසර ලබා ගත යුතු විය. මෙහි ප්‍රතිඵලය වුයේ යුද්ධයෙන් දිවි රැක ගත් තැනැත්තන් ගේ දිවි පෙවෙත නියාමනය කිරිමට හා වාර්තා කිරිම වැළැක් වු අතර බරපතළ මානව හිමිකම් ගැටලු මිළඟ ජනාධිපතිවරයා වෙත විසඳිම පිණිස ඉදිරිපත් කරයි.

ජන මාධ්‍යවේදීන් ඇතුලු විසම්මුතික අදහස් හා මත ප්‍රකාශ කරන අනෙකුත් පුද්ගලයින් ට එරෙහිව කරනු ලබන ව්‍යාජ නඩු පැවරීම් තර්ජන හා පහර දිම් නිමා කරන බවට පමණක් නොව ජන මාධ්‍යවේදීන් ට මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ නිවහල් අදහස් ප්‍රකාශ කිරිම වරදක් කොට සලකා පිඩාවට පත් වු වන් පිළිබඳ ව පරික්ෂණ පවත්වා අධිකරණ ක්‍රියා මාර්ග ගනු ලබන බව ජනාධිපති අපේක්ෂකයින් විසින් ප්‍රකාශ කළ යුතුය. එසේ ම ඔවුහු ;

- කිසිම රාජ්‍ය ආයතනයක නිලධාරියෙක් අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස උල්ලංඝනය නොකරන බවට සහතික විම සහ විෂමාචාරයන් පිළිබඳ සියලු පැමිණිලි වහාම විභාග කිරිමටත් අපරාධකරුවන් අධිකරණය ඉදිරියට ගෙන යන බවටත්,
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් එමගින් සහතික කොට ඇති අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස සීමා කළ පුවත් පත් මණ්ඩල පනත අහෝසි කිරිමට අවශ්‍ය නිති ගෙන එන බවටත්
- මහජනයාට රාජ්‍ය ආයතනයන් හි තොරතුරු ලබා ගැනිම සහතික කිරිම පිණිස අවශ්‍ය නීති සම්පාදනය

## 6 අපරාධ පරීක්ෂණ කාර්‍යක්ෂමව හා අංග සම්පුර්ණව සිදු කරන බවට සහතික විම:

සෑම අපේක්ෂයෙක්ම අපරාධ පරීක්ෂණ කඩිනම් කරන බවට කැප විය යුතු අතර විශේෂයෙන් ම අන්තර් ජාතික අයිතිවාසිකම් හා මානවීය නීතිය සම්බන්ධ පැමිණිලි විභාග කිරීම පිණිස පොලිසියට සම්පුර්ණ සහයෝගය දෙන බවටත් එබදු පරික්ෂණ කඩාකප්පල් කිරිමට ඉඩ නොදෙන බවටත් සහතික විය යුතුය.

ශ්‍රී ලංකාවට මානව අයිතීන් උල්ලංඝනයන් විභාග කිරිම පිණිස විශ්වසනීය හා පිළි ගැනිමක් සහිත යාන්ත්‍රණයක් නොමැත. අපරාධ යුක්ති විනිශ්චය පිළිබඳ සමාලෝචනයේ දි රජය විසින් එබඳු යාන්ත්‍රණයක් පිහිටු විම හා ඊට ජාතික මානව හිමිකම් කොමිසම ශක්තිමත් කිරිමට උවමනා කරන වර පත්‍රයක් ලබා දිය යුතුය. (එක් යෝජනාවක් නම් ස්වාධින නීතිපති වරයෙකු ගේ කාර්යාලයක් පිහිටුවිමයි) කෙසේ වෙතත් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් නොමැති කම මානව හිමිකම් උල්ලංඝනයන් විභාග කිරිම පිණිස තිබෙන එක් බාධාවක් වෙයි. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ වැඩ පිළිවෙළට අවශ්‍ය සම්පත් හා තාක්ෂණික සහාය ලබා දිය යුතුය. අපරාධ විධිවිධාන පණතට සංශෝධන ගෙන එමින් සාක්ෂිකරුවන් ට අවශ්‍ය අවස්ථාවලදි විඩියෝ තාක්ෂණය උපයෝගි කර ගනිමින් සාක්ෂි ලබා දීමටත් එබඳු සාක්ෂිකරුවන් ගෙන් ඔවුන් සාක්ෂි ඉදිරිපත් කරන්නේ කුමන ස්ථානයක සිට ද යන්න ප්‍රසිද්ධියේ හෙළි කිරිම මගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූලව පිහිටුවා ඇති මුලික ආයතනයන් හි ස්වාධිනත්වය සහතික කළ යුතුය. මෙම ආයතන ගණයට මැතිවරණ කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, ජාතික පොලිස් කොමිසම, ජාතික මුල්‍ය කොමිසම, මානව හිමිකම් කොමිසන් සභාව, අල්ලස් හා දූෂණ කොමිසන් සභාව සහ මැතිවරණ කොට්ඨාශ නැවත නිර්ණය කිරිමේ කොමිසන් සභාව ද ඇතුලත්ය[3].

විශේෂයෙන් ම ජාතික පොලිස් කොමිසන් සභාව විසින් පොලිස් නිලධාරින් ට විසින් කරනු ලබන බරපතළ විෂමචාරයන් නියාමනය හා මහජන පැමිණිලි කාර්‍යක්ෂම හා විශ්වාසදායක ලෙස විභාග කිරිම අපේක්ෂා කරයි. ජාතික මානව හිමිකම් කොමිසම නැවත ගොඩ ගත යුතු අතර එමගින් බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කිරිම අපේක්ෂා කෙරේ. ජාතික මානව හිමිකම් කොමිසමට අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන ලබා දිය යුතු අතර මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ ව ස්වාධිනවද, අංග සම්පුර්ණ ව හා කාර්‍යක්ෂම ලෙස ද විභාග කළ යුතුය. තවද නව නීති මගින් ජාතික මානව හිමිකම් කොමිසන් සභාවේ තීරණ පිළි ගැනිම අනීවාර්ය කළ යුතුවෙයි.

[3] 2001 සම්මත කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් රජයේ උසස් තනතුරු වලට පත් කිරිම දේශපාලන ඇඟිලි ගැසිම් වලින් නිදහස් කර ගැනිම අරමුණු කෙරින. උසස් තනතුරු සඳහා කරනු ලබන පත් කිරිම් ආණ්ඩු පක්ෂයේ මෙන් ම විරුද්ධ පක්ෂ නියෝජිතයන් සහ ස්වාධින නියෝජිතයින් ගෙන් සමන්විත ව්‍යවස්ථාදයක සභාව විසින් අනුමත කළ යුතු විය. පසුගිය කාලය තුල මෙම ව්‍යවස්ථාදයක සභාවට නියෝජිතයින් පත් කිරිම විවිධ හේතුන් මත අතපසු කරන ලද අතර මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් උසස් තනතුරු සඳහා සෘජුවම පත් කිරිම් කරන්නට ඉඩ සලසා ගෙන තිබුනි.

පොලිසිය, නිතිපති දෙපාර්තමේන්තුව සහ මානව හිමිකම් කොමිසන් සභාව අතර ඔවුනොවුන් ගේ ස්වාධිනත්වයට හානියක් නොවන පරිද්දෙන් අන්නොන්‍ය සහයෝගිතාවයක් ඇති කිරිම පිණිස අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර මෙම නිති මහජනතාව ගේ දැන ගැනිම පිණිස ප්‍රසිදධ කිරිමෙන් ඔවුන් ට සිය පැමිණිලි විභාග කරන ආකාරය පිළිබඳ වැටහිමක් ලබා ගත හැකිය.

## 8. මානව හිමිකම් කඩ කරන අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන එන ගෙන එන ජාතික ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරිමඃ

යුද්ධමය වාතාවරණය පැවති හා යුද්ධ කලාප තුළ පමණක් නොව මුළු ලංකාව පුරා සාමාන්‍ය කාල වල දි මෙන් ම හදිසි නීතිය බල පවත්වන කාල සීමාව තුළත් මානව හිමිකම් හා මානවීය නීතිය උල්ලංඝණය කරන්නන් හට වරදින් නිදොස් විමට ඉඩ හැරිම සාමාන්‍ය දෙයක් බවට ශ්‍රී ලංකාව තුළ පත් වී තිබේ. ශ්‍රී ලංකාවේ බලයට පත් වන නව ජනාධිපතිවරයාට මානව හිමිකම් ආරක්ෂා කිරිම සම්බන්ධයෙන් සිය කැප විම ප්‍රදර්ශනය කරමින් මෙතෙක් මානව හිමිකම් උල්ලංඝනය කළ අයට වරදින් නිදොස් විමට දී තිබූ නිදහස අවසාන කරන බවත් ඔවුහු නීතියේ රැහනට ගෙන විත් වරදින් නිදොස් විමේ චක්‍රය බිඳ දමන බවත් ප්‍රකාශයට පත් කළ යුතුය. ඔහු තවදුරටත් පසුගිය ආණ්ඩු විසින් සිදු කරන ලද මානව හිමිකම් හා අන්තර් ජාතික මානවීය නීතිය සම්බන්ධයෙන් කරන ලද වැරදි විභාග කොට අපරාධකරුවන්ට ඔවුන් ගේ තරාතිරම නොබලා දඬුවම් දෙන බවට ප්‍රකාශ කිරිම මගින් මානව හිමිකම් හා මානවීය නීතිය ආරක්ෂා කොට පෝෂණය කිරිම තමා ගේ ඇති කැප විම ජනතාවට ප්‍රදර්ශනය කළ හැකිය.

ආණ්ඩු වලට සිය පොරොන්දු ක්‍රියාවට නැංවිම පිණිස විධිමත් පරික්ෂණ පැවැත්විම අපරාධකරුවන් ගේ සමාජ තත්වය හෝ දේශපාලන බලය නොසලකා අධිකරණමය ක්‍රියාමාර්ගයන් ට යොමු කිරිමෙන් කළ හැකිය.

## 9. අන්තර් ජාතික ප්‍රඥප්තීන් අනුමත කිරිමඃ

ජනාධිපති අපේක්ෂකයින් විසින් විශේෂයෙන් ම පහත දැක්වෙන අන්තර් ජාතික ප්‍රඥප්තීන් අනුමත කරමින් හා ඊට අදාළ දේශිය නීති සම්පාදනය, අදාළ ප්‍රතිපත්ති හා භාවිතයන් ඇති  කරන බවට සහතික විය යුතුය.

■ බලහත්කාර අතුරුදහන් කිරීමෙන් සියළු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ අන්තර් ජාතික සම්මුතිය

■ වධ හිංසාවන්ට හෝ කෲර අමානුෂික හෝ පහත් සැලකීමකට හෝ දඬුවමකට හෝ භාජනය කිරීමට එරෙහි අන්තර් ජාතික වෛකල්පික ප්‍රඥප්තිය.

■ අන්තර් ජාතික අපරාධ අධිකරණය පිළිබඳ රෝම ආඥාව.

■ එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කීරීම පිණිස අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම.

මීට අමතරව ජනාධිපති අපේක්ෂකයින් විසින් දැනටමත් ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙක් වන මානව අයිතිවාසිකම් හා මානවීය නීතිය පිළිබඳ ප්‍රඥප්තීන් ට අදළ ජාතික නීති සම්පාදනය, ප්‍රතිපත්ති හා භාවිතයන් ගොඩ නැගිම සිදුකරන බවට කැප විය යුතුය.

## 10. මරණිය දණ්ඩනය අහෝසි කිරිමඃ

මරණීය දණ්ඩනය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකුල නීතියක් වන අතර

මරණීය දණ්ඩනය නියම වුවන් දහසක් පමණ බන්ධාගාර තුල සිටින නමුත් පසුගිය දශක හතරක කාලය තුල මෙරට මරණීය දණ්ඩනය ක්‍රියාත්මක නොකෙරින.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මරණීය දණ්ඩනය ජීවත් විමට ඇති මානව හිමිකම උල්ලංඝනය කරන ඉතාමත් කෲර අමානුෂික පහත් දඬුවමක් ලෙස සලකයි. මරණිය දණ්ඩනය අපරාධ නිවාරණය සම්බන්ධයෙන් සිර දඬුවමට වඩා ඉතාමත් කාර්‍යක්ෂම යැයි සනාථ කිරිමට සාක්ෂි නොමැත. මීට අමතරව ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ බිඳ වැටිමත් සමගම අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් ගෙන් පාපෝච්චාරණ ලබා ගැනිම පිණිස කෲර වධහිංසාවන් ට භාජනය කිරිම පිළිබඳව නිරන්තරයෙන් ම වාර්තා වන නිසා බොහෝ විට අහිංසක මිනිසුන් මරණිය දණ්ඩනයට නියම විමේ ඉඩක් තිබිය හැක.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සියලුම ජනාධිපති අපේක්ෂකයින් ගෙන් මරණිය දණ්ඩනය අහෝසි කරන බවටත් අපරාධ නිවාරණය පිණිස වඩාත් පලදයි විකල්ප ක්‍රම වේදයක් ඇති කරන බවටත් සහතික විය යුතුය.

❖